# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

පොලිස් මූලස්ථානය, කොළඹ 01

පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 895 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 27/05/2024<br>පැය 1235 |

## මාධ්‍ය නිවේදනය

**01. 2024.05.26 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 67 | 190 | තඹ දඟර 02<br>යකඩ බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.05.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහබාගේ පොලිස් වසමේ මාබෝල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 150 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහබාගේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මහබාගේ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව දැව කඳන් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර.**

2024.05.26 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහඔය පොලිස් වසමේ හරස්ගල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව තේක්ක වර්ගයේ දැව කඳන් හා ඉරූ දැව කැබලි සන්තකයේ තබා ගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහඔය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මහඔය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**04. බලපත්‍ර නොමැතිව දැව කඳන් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලය කඳවුර.**

2024.05.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හපුතලේ පොලිස් වසමේ හොරදොරොව්ව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව ගාන්ඩිස් වර්ගයේ දැව කඳන් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හපුතලේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වූ බොරලන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** හපුතලේ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**05. නීති විරෝධි මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2024.05.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් යාපනය පොලිස් වසමේ එල්ලන්දකුලම් මාර්ගයේදී වැටලීමක් සිදු කර **නීති විරෝධී මත් කරල් 40 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**